රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 07/2001

මගේ අංකය :- ආ/1අ/1/38
රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001 අප්‍රියෙල් මස 24 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ආයතන අංශය හා**
**ඒකාබද්ධ සේවා අංශය ප්‍රතිව්‍යුහගත කිරීම.**

1996.04.02 දිනැති 12/96 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ජේදයේ 4 වැනි ජේදයට කරන ලද සංශෝධනය ඉවත් කර පහත දැක්වෙන වගන්තිය ආදේශ කරමි.

**4 බලතල ක්‍රියාත්මක කිරීම.**

"ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රියාත්මක කළ හැකි කවර හෝ බලතලයක් ක්‍රියාත්මක කිරීමටද, ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් දිය හැකි කවර හෝ අනුමැතියක් දීමටද රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාට හැකිය.''

02. ආයතන සංග්‍රහය, සේවා ව්‍යවස්ථාවන්, බඳවා ගැනීම් පරිපාටි සහ වෙනත් උපදෙස් මාලාවන්හි සඳහන් "ආයතන අධ්‍යක්ෂ'' සහ "ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ'' යන නිල නාම වෙනුවට ''ආයතන අධ්‍යක්ෂ ජනරාල්'' සහ "ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්'' යන නිල නාම පිළිවෙලින් ආදේශ කළ යුතුය.

03. ඉහත විධිවිධාන 2001 පෙබරවාරි මස 14 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය